# විද්වත් මණ්ඩලයේ බහුතර යෝජනාව ප්‍රතික්ෂෙපකිරීම

ආණ්ඩුව විද්වත් මණ්ඩලයේ බහුතර යෝජනාව ප්‍රතික්ෂෙප කර ඇත. මේ ඉතා වැදගත් හා දූරදර්ශී තීරණයකි. ඒ සිංහල ජනතාවගේ හඬට කන්දීමකි. ඇතැමුන් කියන්නේ ආණ්ඩුව එසේ තීරණයකිරීමෙන් ප්‍රශ්නය විසඳීමට තිබූ තවත් අවස්ථාවක් නැති වී ගිය බව ය. ඔවුන්ට අනුව ආණ්ඩුව හඬනගා තම මතය ප්‍රකාශකරන සුළුතරයකගේ ඉල්ලීමට අනිසි ආකාරයෙන් හිස නමා ප්‍රශ්නය විසඳීම මගහැර ඇති බව ය. එසේ කියන්නාවූ පිරිස තමන් බහුතරයක් ලෙස සලකන්නේ ද? අද මෙරට බහුතරයකට අවශ්‍ය විද්වත් මණ්ඩලයේ බහුදරයේ යෝජනා ක්‍රියාත්මකකිරීමට ද?

දෙමළ දේශපාලන පක්ෂ විද්වත් මණ්ඩලයේ බහුතරයේ යෝජනාවලට එකඟ ය. එමෙන් ම එක්සත් ජාතික පක්ෂය ද ඒ යෝජනාවලට එකඟ බව එහි නායකයා කරඇති ප්‍රකාශවලින් ගම්‍ය වෙයි. එසේ වුවත් ශ්‍රී ල නි පක්ෂය ඒ යෝජනාවලට එකඟ යැයි පවසා නැත. යේජනා ප්‍රතික්ෂෙපකිරීමට ආණ්ඩුව තීරණයගැනීමෙන් පෙන්නුම්කරන්නේ ශ්‍රි ල නි පක්ෂය අඩුම තරමින් යෝජනා නොපිළිගන්නා බව ය. ජ වි පෙරමුණ. ජා හෙළ උරුමය හා ම එ පෙ යෝජනාවලට විරුද්ධ ය. දේශපාලන පක්ෂ වශයෙන් එසේ වුව ද ජනතාව සම්බන්ධයෙන් ගත්කල තත්වය කුමක් ද? ජනතාවගේ මතය අපට අද දැනගැනීමට ක්‍රමයක් නැත. ඒ සඳහා කළ යුත්තේ ජනමත විචාරණයක් පැවැත්වීම ය. සමීක්ෂණ මගින් මෙරට ජනමතය, විශේෂයෙන් ම සිංහල ජනමතය දැබගැනීම උගහට ය. එසේ නම් මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත්වූ විට ආණ්ඩුව ජනමතය මැනබලන්නේ කෙසේ ද?

අද දේශපලනය කෙරෙන්නේ ජනමාධ්‍ය ඔස්සේ බව අපට අකමැත්තෙන් වුව ද පිළිගැනීමට සිදුවෙයි. ජනමාධ්‍ය ද දේශපාලනඥයන් මෙන් හැසිරෙන බව පෙනී යයි. එක්පැත්තකින් ගත්කල ජනතාව කියවීමට, සවන්දීමට කැමති කරුණු තම මාධය ඔස්සේ බෙදාදීමට ඒ ඒ ආයතන කටයුතුකරන්නේ තම පාඨක, ශ්‍රාවක, ප්‍රේක්ෂක, සංඛ්‍යාව වැඩිකරගනීමට හෝ අඩුම තරමින් රඳවාගැනීම සඳහා ය. අනෙක් පැත්තෙන් ජනමාධ්‍ය තමන්ට අවශ්‍ය දේ ජනතාවට බලහත්කාරයෙන් බෙදාදීමට ද උත්සාහකරයි. ජනතාවගේ ඉන්ද්‍රිය පිනවීමට ඇති කැමැත්ත උපයෝගීකරගෙන තමන්ට අවශ්‍ය කරන දේ ප්‍රචලිතකිරීමට සැරසෙන ජනමාධ්‍ය මෙරට ඇත්තේ එකක් හෝ දෙකක් පමණක් නොවෙයි. දේශපාලන පක්ෂ ලෙස ගත්කල දෙමළ දේශපාලම පක්ෂ, එක්සත් ජාතික පක්ෂය, සහ මාක්ස්වාදී පක්ෂ එලෙස තම ප්‍රතිපත්තති ජනතාවට බෙදාදෙන පක්ෂ වෙයි. එහෙත් ශ්‍රී ල නි පක්ෂයට එසේ කිරීමට නො හැකි ය. ඒ පක්ෂය ජනතාව තමන් වෙත රඳවාගැනීම සඳහා කටයුතුකරන පක්ෂයකි. ඉහත සඳහන් කටයුතු දෙකෙහිදීම දේශපාලන පක්ෂවලට තමන් මෙන් කටයුතුකරන ජනමාධ්‍යය ද අවශ්‍ය වෙයි.

ජනමත විචාරණයකින් තොරව ජනතාවට අවශ්‍යකරන දෑ දැනගතහැකි එක් ක්‍රමයක් නම් ජනමාධ්‍යයෙන් නිරූපණයවන මතය හඳුනාගැනීම ය. එය බොහෝ විට එතරම් පහසු ක්‍රමයක් නොවන මුත් එහි සුළු ඉඩක් නැතිවා නො වෙයි. මෙහි දී ඇතැම් සති අන්ත පුවත්පතක් නගන්වම තම කාර්යභාරයෙහි යෙදී සිටියේ ය. විද්වත් මණ්ඩලයෙහි බහුතර වාර්තාව ඇත්තටම බහුතර වාර්තාවක් ලෙස ඉදිරිපත්කිරීමට ඒ පුවත්පත උත්සාහ කෙළේ ය. සිංහල බහුතරයට දෙමළ ජනයාගේ ප්‍රශ්න ගැන තීන්දුගැනීමට අයිතියක් නැතැයි පවසන මේ පුවත්පත විද්වත් මණ්ඩලයේ බහුතරය හුවාදැක්වීමට උත්සාහ කෙළේ ය. එහෙත් ඒ පුවත්පත කියවන පිරිස ඉතා සුළු බැවින් එයට සිංහල මතය වෙනස්කිරීමට කළහැකි කිසිවක් නො වී ය. මෙවැනි පුවත්පත්වල සිංහල විරෝධී මෙහෙවර හා පුවත්පත්වල ප්‍රතිපත්ති ද සලකාබලා පැමිණිය හැකි නිගමනය නම් අද සිංහල ජනයාගෙන් ඉතා බහුතරය විද්වත් මණ්ඩලයේ බහුතර වාර්තාවෙහි සඳහන් කරුණුවලට තදබල ලෙස විරුද්ධ බව ය.

විද්වත් මණ්ඩලයෙහි බහුතරය ජනතා බහුතරය නියෝජනය නොකරන බව මේ තීරුවෙහි කලින් ද සඳහන් කෙරී ඇත. ඒ බව ප්‍රකාශකිරීමට හේතු ගණනාවක් තිබේ. එකක් ජනතාව මහාමැතිවරණයෙහි දී මෙන් ම ජනාධිපතිවරණයෙහි දී ද ඡන්දය දී ඇති ආකාරය ය. සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම්කෙරෙන්නේ සිංහල ජනතාවගෙන් විශාල බහුතරයක් ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් ඡන්දය දී ඇති බව ය. එමෙන් ම ජනමාධ්‍යවලින් ප්‍රකාශවන දෙය ද ඉහත සඳහන් කරුණු දෙකට සාපේක්ෂව විශ්ලේෂණය කළ විට කියැවෙන්නේ ජනතාව විද්වත් මණ්ඩලයෙහි බහුතරයට විරුද්ධ මතයක් දරණ බව ය. විද්වත් මණ්ඩලයෙහි බහුතරයෙහි දේශපාලනය ද ජනතාවගේ දේශපාලනයට වෙනස් ය. විද්වත් මණ්ඩලයෙහි බහුතරය එක්සත් ජාතික පක්ෂයෙහි, දෙමළ දේශපාලන පක්ෂවල, මාක්ස්වාදී දේශපාලන පක්ෂවල

© Prof. Nalin De Silva

සාමාජිකයෝ හෝ අනුගාමිකයෝ හෝ වෙති. සිංහල ජනතාවගෙන් බහුතරයේ දේශපාලනය නියෝජනයකරන පිරිසක් විද්වත් මණ්ඩලයෙහි බහුතරයෙහි නොමැත.

විද්වත් මණ්ඩලයෙහි බහුතරය ෆෙඩරල්වාදීන්ගෙන් සමන්විත වෙයි. ඔවුන්ගෙන් මෙරටට සරිලන ආණ්ඩුක්‍රමයක් බලාපොරොත්තු විය නො හැකි ය. මේ පිරිස එසේ පත්කෙරුණේ කාගේ අවශ්‍යතාවට ද? ජනාධිපතිතුමා නාමික ව විද්වත් මන්ඩලය පත්කල ද, ඒ සඳහා නම් නිරදේශකෙරුණේ ව්‍යවස්ථා කටයුතු සම්පාදන අමාත්‍යංශයෙනි. ඒ අමාත්‍යාංශය සිංහලත්වය ගැන දරණ ආකල්පය මේ පත්වීම්වලට හේතු වී ඇති බව පැහැදිලි ය. මේ රටේ පතාකෙරෙන කමිටුවල බහුතරයේ අදහස් රටේ ජනතාවගේ බහුතරයෙහි අදහස් සමග සමපාත නොවීම ගැටළුවකි.

මෙහි දී කිවයුතු තවත් කරුණක් වෙයි. විද්වත් මණ්ඩලයෙහි මෙන් ම සර්වපාක්ෂික නියෝජිත කමිටුවෙහි ද බහුතරය සිංහල බහුතරය සමග පැහෙන පක්ෂවලින් සමන්විත වන්නේ නොවේ. ඒ කමිටුවෙහි සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, එ ජා ප හැරුණු විට මුස්ලිම් පක්ෂ හතරක් හා දෙමළ පක්ෂ තුනක් වෙයි. එයට අමතරව ඇත්තේ ශ්‍රී ල නි පක්ෂය, ම එ පෙරමුණ හා ජාතික හෙළ උරුමය ය. යම් අයුරකින් එහි පක්ෂවලට සම්මුතියකට ඒමට නොහැකිවුවහොත්, එවිට බහුතරයේ වාර්තාව කාගේ වාර්තාවක් ද, ඒ වාර්තාවෙහි කුමක් අඩංගු විය හැකි ද යන්න දැනගැනීමට අංජනම් එළි බැලිය යුතු නො වෙයි.

විද්වත් මණ්ඩලයෙහි බහුතරයෙහි වාර්තාව මෙතරම් ඉක්මනින් ම ජනතාව අතරින් ප්‍රතික්ෂෙපවීමට හේතුව කුමක් ද? ඇතැම් පුද්ගලයන්ට අනුව වාර්තාව ප්‍රතික්ෂෙපකිරීම හේතුවෙන් බන්ඩාරනායක මහතා තමන් චෙල්වනායගම් මහතා සමග ඇතිකරගත් වාර්තාව ප්‍රතික්ෂෙප කිරීමට සමාන වරදක් මහින්ද රාජපක්ෂ මහතා කර ඇත. ඔවුන්ට අනුව අනාගතයේ දී යම් දිනෙක වාර්තාව ප්‍රතික්ෂෙපකිරීම ගැන කණගාටුවීමට සිංහලයන්ට සිදුවනු ඇත. මේ පඬියන් සිතන්නේ බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම ප්‍රතික්ෂෙපකිරීම පිළිබඳව සිංහලයන් කණගාටුවන බව ද? ඔවුන් එසේ සිතන්නේ නම් එයින් ම කියන්නේ ඔවුන් සිංහලයන් යැයි කියාගත්ත ද සිංහලයන් ගැන නොදන්නා බව ය.

බණ්ඩාරනායක චෙල්වනායගම් වාර්තාව ක්‍රියාත්මක නොවීම පිළිබඳ ව සිංහලයන්ගේ ඇත්තේ කැමැත්තකි. සිංහලයන් එයට විරුද්ධවීමට හේතු වූ කරුණු අතර ඉඩම් අයිතිය හා පැවරීම පිළිබඳව එහි සඳහන් වූ දෑ, රටසභා එක්කිරීමට ඉඩතිබීම, ආදිය විය. විද්වත් මණ්ඩලයෙහි බහුතරයෙහි යෝජනා අතර ද එවැනි දේ වෙයි. ඊනියා ජනපද ඇතිකිරීම පිළිබඳව දෙමළ ජාතිවාදීන් දක්වන කරුණු මුළුමනින් ම වැරදි ය. නැගෙනහිර පළාතේ දෙමළ හා මුස්ලිම් ජනයා පදිංචි වී ඇත්තේ වෙරළබඩ තීරුවෙහි පමණ ය. රට අභ්‍යන්තරයෙහි එදා ඒ පළාතෙහි ද පදිංචි වී සිටියෝ සිංහලයෝ ය. ඊනියා ජනපදකරණ ඇතිකරන ලද්දේ එසේ සිංහලයන් එවකටත් පදිංචි වී සිටි පෙදෙස්වල ය. නැගෙනහිර පළාතේ බහුතරය සිංහල නොවූ පමණින් පළාතේ අභ්‍යන්තරය සිංහලයන්ට අහිමිකරන්නේ කිනම් පදනමකින් ද?

විද්වත් මණ්ඩලයෙහි බහුතරය තම වාර්තාවෙන් ප්‍රකාශකරන කරුණු ක්‍රියාත්මක කිරීම බණ්සාරනායක චෙල්වනායගම් ගිවිසුම ක්‍රියාත්මක කිරීමටත් වඩා භයානක ය.  එහි ඇති ප්‍රධාන යෝජනා සියල්ල සිංහල ජනතාව විසින් විටින් විට ප්‍රතික්ෂෙප කෙරී ඇති කරුණු ය. ඉඩම් අයිතිය හා උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීම ඒ අතර ප්‍රධාන වෙයි. ජනතාව ප්‍රතික්ෂෙපකළ කූට මණ්ඩලය (ඒපෙක්ස් බොඩි) නැවතත් ඉදිරිපත් වී ඇත. මේ යෝජනා මගින් සිංහලයන්ට උතුරු හා නැගෙනහිර පළාත් අහිමි වෙයි. කිනම් ස්වරූපයකින් කිනම් අය අතින් ඉදිරිපත්කරනු ලැබුව ද සිංහලයෝ එවැනි යෝජනාවලට විරුද්ධවෙති. පඬියන් සිතන්නේ විවිධ උපාමාරුවලින් සිංහලයන් එක්වරක් ප්‍රතික්ෂෙපකළ යෝජනා වෙනත් ආකාරයකින් නැවතත් ඉදිරිපත්කර සිංහලයන් රවටා සම්මතකර ගැනීමට ය. ඒ කිසි දිනෙක කළහැකි දෙයක් නොවේ. උතුරු හා නැගෙනහිර පළාත් කිනම් ආකාරයකින් හෝ එක්කරන, ඉඩම් අයිතිය මධ්‍යයට අහිමිකරන, පොලිස් බලතල ඊනියා ප්‍රාන්තවලට පවරන, විදේශවලින් ඒ ඒ ප්‍රන්තවලට ආධාර සැපයිය හැකි ව්‍යවස්ථාවකට සිංහලයෝ එකඟ නො වෙති. සිංහලයන්ගේ එකඟත්වයක් නොමැතිව දෙමළ ජාතිවාදී ප්‍රශ්නය විසඳීමට යමකු තැත්කරන්නේ නම් ඒ අපරිණතබව, මුග්ධබව හෝ සිංහල විරෝධත්වය හෝ නිසා කෙරෙන්නකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva